**ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය - 2025**

**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලයේ (“මණ්ඩලය”) 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 1930 අංක 10 දරන රබර් පර්යේෂණ ආඥා පනතේ, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි මණ්ඩලයේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- මණ්ඩලය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- මණ්ඩලය සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XV පරිච්ඡේදයේ 4:7 වගන්තිය | අධ්‍යයන කටයුතු සඳහා වැටුප් සහිත නිවාඩු ලබා විදේශගත වී බැඳුම්කර කොන්දේසි කඩකළ නිලධාරීන් 02 දෙනෙකුගෙන් 2025 දෙසැම්බර් 31 දිනට වර්ෂ 35ක් ඉක්මවා ඇති අයනොකළ වටිනාකම වූ රු.2,761,933 ක් අය කර ගැනීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඇපකර බැඳුම්කර පියවීමට ඇති නිලධාරීන් සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කරන ලදී. ඒ අනුව ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.55,345,347 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 120,923,726 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.65,578,379 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ ප්‍රදාන රු.134,082,395 කින් හා වතු ආදායම් රු.28,037,108 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| අයිතමය | සමාලෝචිත වර්ෂය රු. | ඉකුත් වර්ෂය රු. | ඉකුත් වර්ෂය සමඟ වෙනස් වීම රු. | වෙනස්වීමේ ප්‍රතිශතය සියයට |
|---|---|---|---|---|
| රජයේ ප්‍රදාන | 578,291,838 | 444,209,443 | 134,082,395 | 30 |
| වෙනත් ආදායම් | 14,398,947 | 37,972,808 | (23,573,861) | (62) |

| | | | | |
|---|---|---|---|---|
| වතු ආදායම් | 147,119,126 | 119,937,401 | 27,181,725 | 23 |
| වැටුප්, වේතන හා සේවක ප්‍රතිලාභ | 425,650,467 | 373,984,958 | 51,665,509 | 14 |
| සැපයුම් හා පරිභෝජන වියදම් | 32,234,697 | 38,963,837 | (6,729,140) | (17) |
| ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් | 121,470,968 | 127,053,972 | (5,583,004) | (4) |
| වෙනත් වියදම් | 129,694,605 | 120,945,903 | 8,748,702 | 7 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පසුගිය වසරට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වෙනත් ආදායම් සියයට 62 කින් අඩු වී තිබුණු අතර පුහුණු හා උපදේශන ආදායම් අඩුවීම මෙම තත්ත්වයට සෘජුව බලපා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදාන ලෙස රු. මි. 578.29 ක් එනම් පසුගිය වර්ෂයට සාපේක්ෂව රජයේ ප්‍රදාන සියයට 30 කින් වැඩිවී තිබුණි.

**2.3 අනුපාත විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙලින් 3.48:1 ක් හා 2.69:1 ක් වූ අතර ඉකුත් වර්ෂයේදී එම අගයන් පිළිවෙලින් 2.9:1 ක් හා 2.3:1ක් විය. ජංගම වත්කම් රු. 6,358,829 කින් වැඩිවීම හා ජංගම් වගකීම් රු.4,285,590 කින් අඩුවීම, ජංගම අනුපාතය සහ ක්ෂණික වත්කම් අනුපාතය වර්ධනයට හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1991 වර්ෂයේ කුරුවිට වත්තේ හෙක්ටයාර් 6.5 කොටසේ වගා කල රබර් ගස් ඉවත් කිරීමේ ගිවිසුමේ 12 වන වගන්තිය ප්‍රකාරව පූර්ව ගෙවීම් රිසිට්පත් සත්‍යාපනය නොකර සියලුම රබර් ගස් ඉවත් කර ගැනීමට ඉඩ හැරීමෙන් රු. 1,677,284 ක හිඟ මුදලක් 2026 ජූලි 16 දින වන විටත් අයකර නොතිබීම, 1993 වගාවේ ගස් 472 ක් සඳහා අයවිය යුතු රු. 2,369,275 න් රු. 71,064 ක අඩුවක් පැවතීම සහ 1994 හා 1988 වගා බිම් කොටස්වල ගිවිසුමේ 16 වන වගන්තියට අනුව ගැණුම්කරුවන් ගණන් කර භාරගත් මැරුණු/දිරාපත් වූ ගස් වෙනුවෙන් කොන්දේසිවලට පටහැනිව පිළිවෙළින් රු. 16,700 ක | කුරුවිට වත්තේ මුල් ගිවිසුම් ප්‍රකාරව අවසානයේ පැවති භෞතික තත්වය මත ගෙවිය යුතුව ඇති හිඟ මුදල වන රු. 731,469.00ක් කොන්ත්‍රාත්කරු හට වහාම ගෙවන ලෙස ජොෂ්ය වතු කළමනාකරු විසින් දැනුම් දී ඇත. 1993 වගාවේ ගිවිසුම් ප්‍රකාරව රු 2,369,275 ක මුදලක් ගෙවීමට කොන්ත්‍රාත්තුව ආරම්භයේ යෝජිතව තිබූ නමුත් ගස්වල භෞතිකව සිදුව තිබූ වෙනස හේතුවෙන් ගෙවීමට ඇති හිඟ වටිනාකම රු 51,015 ක් මේ වන විට පියවා ඇත. | ගිවිසුම් කොන්දේසිවලට පටහැනිව කටයුතු කිරීම හේතුවෙන් සිදු වූ අලාභය අදාල පාර්ශවයන්ගෙන් අය කරගත යුතුය. |

සහ රු. 33,250 ක මුදල් අඩු කිරීම හේතුවෙන් සමස්තයක් ලෙස සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු. 1,798,298 ක අලාභයක් සිදු වී තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර දෙකකට ආසන්න කාලයක සිට අංශුමාත්‍ර පරිමිත සේවා මධ්‍යස්ථානයේ (FEAS CENTER) කාර්යයන් සම්පූර්ණයෙන්ම නවත්වා තිබුණු බැවින් අදාල ගොඩනැගිල්ල හා රු. 38,918,694 ක් පිරිවැය වූ පරිගණක හා මෘදුකාංග, යන්ත්‍ර, ලීබඩු හා කාර්යාල උපකරණ සියල්ල නිශ්කාර්යව පැවතුණි. එම FEAS මධ්‍යස්ථානයේ 2018-2023 ප්‍රගතිය දැක්වූ වාර්තාව අනුව ගිවිසුමේ දෙවන පාර්ශවය වන ශ්‍රී ලංකා ප්ලාස්ටික් හා රබර් මණ්ඩලය විසින් රු.8,141,743 ක් අදාල ගිවිසුම් කාල සීමාව තුල උපයා තිබු නමුත් මෙම ගිවිසුමේ පලමු පාර්ශවය වන මණ්ඩලය වෙත කිසිදු මුදලක් ලැබී නොතිබුණි. | PRISL හා RRISL අතර අත්සන් කර තිබු අවබෝධතා ගිවිසුම අනුව දෙපාර්ශවයේ වගකීම් වෙන් වෙන්ව දක්වා තිබුණි. එහිදි රබර් පර්යේෂණ ආයතනය මගින් මෙම මධ්‍යස්ථානයට අවශ්‍ය උපකරණ මිලදී ගැනිම, මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට අවශ්‍ය ස්ථානයක් අවශ්‍ය මුලික පහසුකම් සමග සපයා දිමට එකඟ වී තිබුණි. ඒ අනුව ගිවිසුම ප්‍රකාරව කටයුතු කර ඇත. | නිෂ්කාර්ය වත්කම් ඵලදායී කාර්යයකට යොදාගත යුතුයි. |
| (ආ) | මණ්ඩලයට අයත් ඉඩම් සහ ගොඩනැඟිලි 43කට අධික ප්‍රමාණයක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව භාවිත කරනු ලබන අතර මෙම ඉඩම් මණ්ඩලය වෙත ලබා ගැනීමට හෝ දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඒ අනුව කටයුතු කරනු ඇත. | මණ්ඩලයට අයත් ඉඩම් සහ ගොඩනැඟිලි වල අයිතිය නිරවුල් කර ගත යුතුය. |
| (ඇ) | මණ්ඩලයට අයත් මුළු නිල නිවාස 86 න් නිල නිවාස 17ක් වර්ෂ 1 සිට වර්ෂ 6 ක කාලයක් දක්වා කිසිවෙකු පදිංචි වී නොසිටි අතර එම නිල නිවාස අලුත්වැඩියා කළ යුතු තත්වයේ පැවතුණි. | ඉදිරියේදී ලැබෙන ප්‍රතිපාදන වලට යටත්ව මෙම නිල නිවාස වල අත්‍යාවශ්‍ය අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | නිල නිවාස ඵලදායිව උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මණ්ඩලය විසින් භාවිතා කරනු ලබන මොනරාගල කුමාරවත්ත හා අලව්ව නාරම්පොලවත්ත යන වතු සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් මණ්ඩලය වෙත විධිමත් පරිදි පවරා ගෙන නොතිබුණි. | ඉඩම අත් කර ගැනීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | වතුවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය සමඟ 2017 වර්ෂයේදී ගිවිසුම්ගතව 2022 වර්ෂයේදී අවසන් කිරීමට නියමිතව තිබුණු කුඩා රබර් ඉඩම් හිමියන් සඳහා ජීව ඉන්ධන දැව වර්ග හඳුන්වා දීමේ නියමු ව්‍යාපෘතියෙහි කාර්යයන් සාර්ථකව නිම නොකිරීම හේතුවෙන් ඒ සඳහා ලැබී තිබුණු රු.10,457,200 ක මුදලින් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් රු.4,283,644 ක් එනම් සියයට 40 ක මුදලක් ඉතිරිව තිබුණි. | ව්‍යාපෘති කාලසීමාව තුළ රටතුළ පැවති කොවිඩ් 19 වසංගත තත්වය සහ ඉන්ධන අර්බුදය හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාකාරකම් පහත වැටීමට බලපාන ලද බවයි. | ගිවිසුම්ගත කාර්යයන් අදාල කාලය තුලදී සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේ රු.4,052,300 ට මිලදී ගෙන තිබුණු රබර් පර්යේෂණ කටයුතු සඳහා භාවිතා කරන Mooney Viscometer යන්ත්‍රයේ මෘදුකාංග දෝෂයක් හේතුවෙන් 2018 වර්ෂයේ සිට විගණිත දින දක්වා අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | Mooney Viscometer අළුත්වැඩියා කල හැකි ද යන්න සොයා බැලීම සඳහා විශේෂඥ දැනුමැති පුද්ගලයෙකුගේ සේවාව ලබා ගැනීමට කටයුතු යොදා ඇත. | උපකරණ ඵලදායීතාවයෙන් යුතුව භාවිතයට ගත යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 11 දින රබර් පර්යේෂණ කටයුතු සඳහා රු.20,034,200 කට මිලදී ගෙන තිබු GC – MS යන්ත්‍රය 2026 පෙබරවාරි 13 දින වන විටත් භාවිතයෙන් තොරව පැවතුණි. | ගොඩනැගිල්ලේ නඩත්තු කටයුතු සිදු කිරීමෙන් පසු මෙම උපකරණ නියමිත පරිදි ස්ථාපනය කොට පූර්ව පරීක්ෂණ කටයුතු සිදු කරයි. | යන්ත්‍රය පර්යේෂණ කටයුතු සඳහා භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | රු.2,064,855ක් වැයකර 2021 ඔක්තෝබර් 29 දින මිලදි ගෙන | Fume hood යන්ත්‍රය මේ වන විට අළුත්වැඩියා කටයුතු සිදු කරමින් | යන්ත්‍රය ඵලදායිව උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණු Fume Hood යන්ත්‍රය 2024 වර්ෂයේ සිට අලුත්වැඩියා කළ යුතුව පැවතුණද 2026 මාර්තු 05 දින වනවිටත් එම අලුත්වැඩියාවන් සිදු කර නොතිබුණි. | පවතී. | |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1988 වර්ෂයේ ඩාර්ටන් ෆිල්ඩ් වතුයායේ වගා කළ හෙක්ටයාර් 4.83 කොටසේ රබර් ගස් ඉවත් කිරීමේ ගිවිසුමේ 07 වන වගන්තිය ප්‍රකාරව රබර් ගස් 1,156න් ගස් 1,000ක මුල් ඉවත් කිරීමට ගැණුම්කරු කටයුතු කර නොමැති අතර, 04 වන වගන්තිය අනුව ඊට එරෙහිව සුදුසු පියවර ගැනීමට පාලනාධිකාරියද අපොහොසත් වී ඇත. මේ හේතුවෙන් අදාළ මුල් ඉවත් කිරීමට රබර් පර්යේෂණ ආයතනයට දැරීමට සිදුවන අධික පිරිවැය රු.200,000ක ඇපකරයෙන් ආවරණය කරගත නොහැකි වී තිබුණි. | මෙහි දියපර සහිත සණුව වැඩුනු කැලෑවක් සහිත ප්‍රදේශයක් ඇති නිසා මෙම කැලෑව ඉදිරි අගෝස්තු මස වියලි කාලගුණය සමඟ සුද්ධ කර ගිනි තැබීම සිදු කිරීමට බලාපොරොත්තු වන බව ජ්‍යෙෂ්ඨ වතු අධිකාරි විසින් සඳහන් කර ඇත. | ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1991 වර්ෂයේ හෙක්ටයාර් 6.5 ක් වගා කල කුරුවිට කොටසේ රබර් ගස් ඉවත් කිරීමේ ගිවිසුම්ගත කාලසීමාව (2025/10/20) ඉක්මවා කිසිදු ලිඛිත ඉල්ලීමක් හෝ අනුමැතියක් නොමැතිව ගිවිසුම් කොන්දේසිවලට පටහැනිව රබර් ගස් ගැලවීමට ඉඩ හැරීමෙන් හා ගිවිසුමේ 04 වන කොන්දේසිය ප්‍රකාරව අතිරේක අධ්‍යක්ෂවරයා ලවා කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට ජ්‍යෙෂ්ඨ වතු කළමනාකරු කටයුතු නොකිරීමෙන් සිදුව ඇති කාල ප්‍රමාදය සහ රජයට සිදු වූ මූල්‍යමය අලාභය සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | පැවති වර්ෂා සහිත කාලගුණය වැනි ස්වාභාවික තත්ව යටතේ ගස් ගලවා ඉවත් කිරීම ප්‍රමාද වී ඇත. නමුත් එම ගස් මූලික ඇස්තමේන්තු මිලට වඩා ඉහල වටිනාකමකට කොන්ත්‍රාත්කරු හට ප්‍රදානය වී තිබූ බැවින් කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමකින් තොරව අවසන් අදියර ඉදිරියට කරගෙන ගිය බව දක්වා ඇත. | ගිවිසුමේ කොන්දේසි කඩ කිරීමට අදාළව වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගත යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2025 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත තනතුරු 460 න් 209 ක් පුරප්පාඩුව පැවති බව නිරීක්ෂණය විය. එයින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් ගේ අනුමත තනතුරු සංඛ්‍යාව වූ 88 න් 59ක් පුරප්පාඩුව පැවතුණි. | පිළිතුරු ලබා දී නොමැත. | පුරප්පාඩු කඩිනමින් පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ආයතනයේ ප්‍රධාන රාජකාරි (කළමනාකරණ සහකාර සේවය සහ රසායනාගාර සහකාර) සඳහා දෛනික වැටුප් ලබන වසර 01 සිට වසර 11 දක්වා සේවා කාලයක් සහිත නිලධාරීන් 25 ක් මණ්ඩලයට අනුයුක්තව සේවයේ යොදවා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත පමණක් බඳවා ගැනීම් සිදු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අරමුණු සහ සංයුක්ත සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉහළයන ඉල්ලුමට සරිලන පරිදි දේශීය ස්වාභාවික රබර් නිෂ්පාදනය නගා සිටුවීම ආයතනයේ අරමුණක් වුවද අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව අනුව 2024 වර්ෂයේ රබර් නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 69 වුවත් 2025 වර්ෂය වන විට රබර් නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 62 දක්වා අඩු වී ඇති බැවින් එම අරමුණ ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අත්පොතේ 2.3 වගන්තිය ප්‍රකාරව | පිළිතුරු ලබා දී නොමැත. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

සංයුක්ත සැලැස්මක් සකස් කළ යුතු වුවත් මණ්ඩලය විසින් 2025 වර්ෂය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ අරමුණු කරගත් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රවේණි හා ශාක අභිජනන දෙපාර්තමේන්තුවේ වාර්ෂික හස්ත පරාගණය කිරීමේ (HP) වැඩසටහනේ 2025 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව රු.200,000 ක් වැය කර නව ප්‍රවේණි වර්ග 200ක් සංවර්ධනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණද භෞතික ප්‍රගතිය අනුව ප්‍රවේණි වර්ග 30ක් පමණක් සංවර්ධනය කර තිබූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 15 ක පහළ අගයක් විය. | අයහපත් කාලගුණික තත්ත්වයන් සහ රෝග තත්ත්වයන් හේතුවෙන් බීජ වර්ධනය හා බීජ ප්‍රරෝහණය දැඩි ලෙස බලපෑමට ලක්විය. | අපේක්ෂිත ව්‍යාපෘතිය ඵලදායීව ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | ශාක විද්‍යා දෙපාර්තමේන්තුවේ රබර් තවාන් සඳහා ස්වයංක්‍රීය ක්ෂුද්‍ර වාරිමාර්ග පද්ධතියක් හඳුන්වා දීමට රු.300,000ක් ඇස්තමේන්තු ගත මුදල සම්පූර්ණයෙන් වියදම් කර ඇතත් එහි මූලාකෘති පද්ධතියක් (prototype system) සංවර්ධනය කිරීම පමණක් සිදු කර ඇති අතර එය ක්ෂේත්‍රය සඳහා හඳුන්වාදීමක් සිදුකර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය මොරටුව විශ්වවිද්‍යාලය සමඟ ඒකාබද්ධව සිදු කරන ලද අතර ස්වයංක්‍රීය පද්ධතියේ තවදුරටත් වැඩි දියුණු කිරීමක් සඳහා ඔවුන් වෙත ලබා දී ඇත. එහි ප්‍රතිඵලය අනුව ඉදිරි පර්යේෂණ සැලසුම් කරනු ලැබේ. | අපේක්ෂිත ව්‍යාපෘතිය කාලීනව අවසන් කළ යුතුය. |